# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2463/04 - 2025 නොවැම්බර් මස 17 වැනි සඳුදා - 2025.11.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**එල්. ඩී. - බී 24/1951 (XVIII)**

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වන වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග සහ
නාගරික සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2022 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 2301/17 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 අංක 03 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර අයහාර) නියෝග, එහි I වන උපලේඛනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 12 වන අයිතමයේ, I වන තීරයේ, II වන තීරයේ සහ III වන තීරයේ සටහන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-


1A - PG 7353 — 453 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| "I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| 12. (අ) ශ්‍රී ලංකාවෙන් බැහැරව නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් හෝ ඒ හා සමාන යම් රියදුරු බලපත්‍රයක් දරන්නකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වෙත රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම | 30,000.00 | 30,000.00 |
| (ආ) ශ්‍රී ලංකාවෙන් බැහැරව නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් හෝ ඒ හා සමාන රියදුරු බලපත්‍රයක් දරන්නකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු වෙත රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම | 60,000.00 | 60,000.00" |

(2) එහි 13 වන අයිතමයේ, I වන තීරයේ, II වන තීරයේ සහ III වන තීරයේ සටහන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| "I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| 13. (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු වෙත රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම | 45,000.00 | 45,000.00 |
| (ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු වෙත නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් අලුත් කිරීම | 15,000.00 | 15,000.00 |
| (ඇ) රියදුරු බලපත්‍රය විනාශ වී, දුර්වර්ණ වී හෝ හානි වී ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු වෙත එම රියදුරු බලපත්‍රයේ අනුපිටපතක් නිකුත් කිරීම | 15,000.00 | 15,000.00 |
| (ඈ) රියදුරු බලපත්‍රය හානි වී ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු වෙත එම රියදුරු බලපත්‍රයේ අනුපිටපතක් නිකුත් කිරීම | 30,000.00 | 30,000.00" |

(3) එහි 14 වන අයිතමයේ, I වන තීරයේ, II වන තීරයේ සහ III වන තීරයේ සටහන් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :-

| "I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| 14. (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන ආගන්තුකයකු වෙත තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම<br>(i) මාසයක කාලසීමාවක් සඳහා | 15,000.00 | 15,000.00 |
| (ii) මාසයකට වැඩි සහ මාස දෙකක් දක්වා කාලසීමාවක් සඳහා | 21,000.00 | 21,000.00 |
| (iii) මාස දෙකකට වැඩි සහ මාස හයක් දක්වා කාලසීමාවක් සඳහා | 30,000.00 | 30,000.00 |
| (iv) මාස හයකට වැඩි සහ මාස දොළහක් දක්වා කාලසීමාවක් සඳහා | 45,000.00 | 45,000.00 |
| (ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන ආගන්තුකයකු වෙත තාවකාලික රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීම<br>(i) මාස තුනක කාලසීමාවක් සඳහා | 15,000.00 | 15,000.00 |
| (ii) මාස තුනකට වැඩි සහ මාස හයක් දක්වා කාලසීමාවක් සඳහා | 18,000.00 | 18,000.00 |
| (iii) මාස හයකට වැඩි සහ මාස දොළහක් දක්වා කාලසීමාවක් සඳහා | 24,000.00 | 24,000.00" |

EOG 11-0121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.